**මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - 2013**

**---------------------------------------------------------------**

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය කළමනාකරණය විසින් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

**---------------**

## 2.1 මතය ව්‍යාචනය

**-----------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් ගිවිසුම් හා බැඳුම්කර කඩකළ කථිකාචාර්යවරයෙකුගෙන් අයවිය යුතු රු. 2,476,373 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලහෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලියාහරින ලද වටිනාකම ශුන්‍ය අගයක් වන දැනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු.42,256,135 ක් වූ දේපළ පිරියත හා උපකරණ නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.3,987,088 ක සේවක පාරිතෝෂික වෙන්කිරීම් සේවක පාරිශ්‍රමික වියදම් යටතේ දැක්වීම වෙනුවට වෙනත් මෙහෙයුම් වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂයට අදාළ මෝටර් රථ ක්ෂය වටිනාකම රු.653,333 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ මෝටර් රථ වටිනාකම හා පොදු සංචිත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ඉදිරියට ගෙනවිත් තිබූ වසර 2 ක් ඉක්මවූ පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු රු.542,650 ක් ආයතනයේ ආදායම ලෙස ගැලපීම වෙනුවට මුදල් රෙගුලාසිවලට අනුකූල නොවන ලෙස සංවර්ධන අරමුදල් ගිණුමට මාරුකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යයන්ගෙන් ලද විද්‍යාගාර හා පුස්තකාල තැන්පතු රු.481,500 ක් ගෙවිය යුතු ගිණුම් යටතේ දැක්වීම වෙනුවට පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු ලෙස නව අරමුදල් ගිණුමක සටහන් කර තිබුණි.

(ඊ) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා ආදී ශිෂ්‍ය සංවිධානය මඟින් 2010 වර්ෂයේ පරිත්‍යාග කර තිබූ මුදලින් ඉතිරිව තිබූ රු.118,286 ක වටිනාකම පරිත්‍යාග ලෙස දැක්වීම වෙනුවට ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි.

### 2.2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

සේවයෙන් ඉවත් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.98,940 ක සේවක ණය නැවත අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීමේ පිටවීමේ සටහන් ඉදිරිපත් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික වූ රු.37,625,690 සම්බන්ධයෙන් සනාථ කර ගැනීමට නොහැකි වූ අතර කථිකාචාර්යවරු කරන ලද දේශන පැය තහවුරු කර ගැනීම සඳහා වූ ශිෂ්‍ය පැමිණීමේ ලේඛණද විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ බැවින් එම විෂයය සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

### 2.2.5 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත සෑම නිලධාරියෙකුම පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයක සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලය එ පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කල නමුත් මාස 06 ක් තුල උපලබ්ධි නොවූ රු.115,990 ක් වූ චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 570 | කල් ඉකුත්ව ඇති තැන්පතු, ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවත් වර්ෂ 03 ඉක්ම වූ ටෙන්ඩර් තැන්පතු වටිනාකම වූ රු.42,250 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 1997 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සහ 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මොරටුව විශ්වවිද්‍යාලයේ සේවය කරන නිලධාරීන් දෙදෙනෙකු අදාළ ලිත් මාසය තුළදී මොරටුව විශ්වවිද්‍යාලයේ නිවාඩු දින රාජකාරි සිදුකර ඒ සඳහා නිවාඩු දින දීමනාව ලබාගෙන තිබියදී, එම මාසයේම වෙනත් දිනවල නියමිත සීමාව ඉක්මවා දින 01 සිට 07 දක්වා තාක්ෂණික ආයතනයේද නිවාඩු දින සේවය කිරීමෙන් නිවාඩු දින දීමනාව ලෙස රු.20,992ක් ලබාගෙන තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

--------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් රු.2,804,799 ක අතිරික්තයක් ලැබූ අතර ඉකුත් වර්ෂයේදී එය රු.3,510,686ක ඌනතාවයක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**4.1 කාර්යසාධනය**

---------------

පසුගිය වර්ෂ 05 තුළ ආයතනයට බඳවා ගත් ශිෂ්‍යයින්, ඉගෙනුම ලැබූ ශිෂ්‍යයින් හා පිටව ගිය ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව සහ වාර්ෂිකව දැරූ අයහාර වියදම්වල විස්තරයක් පහත දැක්වේ.

| | | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව | | 987 | 987 | 1,016 | 1,043 | 1,037 |
| බඳවා ගැනීම් | | 360 | 360 | 358 | 352 | 347 |
| අවසාන වර්ෂයේදී ආයතනයෙන් බාහිරව පුහුණුවීම් කටයුතු, කරන බැවින් එසේ ආයතනයෙන් බැහැරව සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | | 295 | 310 | 329 | 347 | 344 |
| ආයතනය තුළ ඉගෙනීම කළ සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව | | 692 | 677 | 687 | 696 | 693 |
| ඩිප්ලෝමාධාරීන් | | 336 | 299 | 296 | 289 | 315 |
| වාර්ෂික අයහාර වියදම | රු. | 78,644,210 | 83,482,537 | 90,462,255 | 99,252,520 | 121,024,043 |
| ඒක ශිෂ්‍ය වියදම | රු. | 113,648 | 123,312 | 131,671 | 142,604 | 174,638 |
| මහපොළ ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | | 206 | 204 | 208 | 210 | 210 |
| ශිෂ්‍යාධාර ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | | 451 | 494 | 499 | 475 | 441 |

පහත  සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා 09 ක් පවත්වනු ලබන අතර 2009 වර්ෂයේදී ඩිප්ලෝමා  සඳහා බඳවා  ගත් ශිෂ්‍යයින් 360 කින් 2013 වර්ෂයේදී ඩිප්ලෝමා සමත් වූ ශිෂ්‍යයින් 315 ක් හෙවත් සියයට 88 ක් විය.

(ආ) තාක්ෂණ ආයතනය ආරම්භ කරන ලද 2000 වර්ෂයේදී බඳවා ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව 350 ක් වූ අතර 2013 වර්ෂයේදී බඳවා ගත් ශිෂ්‍යයින් 347 ක් විය. මේ අනුව ආයතනය පිහිටුවා වර්ෂ 13 ක කාලයක් ගතවී තිබියදීත්, බඳවා ගැනීම්වල වර්ධනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 හා 2010 වර්ෂවල දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.1,618,050 ක් අරමුණුගත කාර්යයන් ඉටු නොකර, වෙනත් අරමුදල් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) 2010 ජුලි මාසයේ ආරම්භ කරන ලද පොලිමර් කෙටිකාලීන පාඨමාලාව මාස 10 කින් නිමකල යුතු වුවත් එය  නිමකිරීමට මාස 23 ක කාලයක් ගතකර තිබුණි. මේ හේතුවෙන් ශිෂ්‍ය විශ්වාසය  පළුදු වීම නිසා සමාලෝචිත වර්ෂයේදී පොලිමර්  පාඨමාලාව ආරම්භ  කිරීම සඳහා රු.84,336 ක් වැයකර පුවත්පත් දැන්වීමක් පලකළද, මේ දක්වා කිසිදු  ශිෂ්‍යයකු බඳවා ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව ගෙවීම වෙනුවෙන් පෞද්ගලික සමාගමකින් ලද ශිෂ්‍යත්ව අරමුදලක් වෙත පෙර වර්ෂවලදී පරිත්‍යාග වශයෙන්  ලබාදී තිබූ රු.113,971 ක් ප්‍රදානය සමාලෝචිත වර්ෂය  තුළදී උපයෝජනය කර නොතිබුණි.

(ආ) බාහිර ක්‍රියාකාරකම් සඳහා ලැබී ඇති රු.7,970,715 ක අරමුදල් වලින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | කථිකාචාර්ය | 27 | 18 | 9 |
| (ii) | ආධුනික කථිකාචාර්ය | 17 | 13 | 4 |
| (iii) | ඉංජිනේරු විද්‍යාගුරු සහකාර | 15 | 2 | 13 |
| | එකතුව | 59 | 33 | 26 |

(ආ) අනෙකුත් කාර්ය මණ්ඩලය

| | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 5 | 5 | - |
| (ii) | මාණ්ඩලික නොවන | 29 | 16 | 13 |
| | එකතුව | 34 | 21 | 13 |

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කථිකාචාර්ය තනතුරු සංඛ්‍යාවෙන් සියයට 33 ක් ද, ආධුනික කථිකාචාර්ය තනතුරු සංඛ්‍යාවෙන් සියයට 23 ක් ද, ඉංජිනේරු විද්‍යාගුරු සහකාර තනතුරු සංඛ්‍යාවෙන් සියයට 86 ක් ද පුරප්පාඩුව පැවතුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

2011/2015 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙළ කර තිබුණද ඒ සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මේ දක්වා ලබාගෙන නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සෑම ආයතනයක්ම ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතු වුවත්, 2011 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) උපයෝගී ලේඛන

(ඇ) සේවක ණය

(ඈ) ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

(ඉ) අයවැය පාලනය

(ඊ) වත්කම් පාලනය

(උ) අභ්‍යන්තර විගණනය

(ඌ) අත්තිකාරම්